# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2122/53 - 2019 මැයි මස 10 වැනි සිකුරාදා - 2019.05.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(x)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 64697 දරන සමාගමක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2017 අගෝස්තු මස 16 වැනි දින අංක 2032/23 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි වලට යටත්ව එහි I වන තීරයේ දැක්වෙන ''නැනෝ සහ උසස් තාක්ෂණය පිළිබඳ දර්ශනපති උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන් හි (SLQF) නියම කරනු ලැබ ඇති ආකාරයෙන් පහත සඳහන් අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් වලට අනුකූලව කටයුතු කළ යුතු ය :-

(අ) ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ දර්ශනපති උපාධිය සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

(ආ) ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ ශාස්ත්‍රපති උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

1A - PG 4514 — 517 (2019/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**I වන උපලේඛනය** *(සම්බන්ධිතයි)*

(ඈ) GPA අගය 0-4 ක පරිමාණයකින් අවම වශයෙන් 3.0 අගයක් සමඟ ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ SLQF 6 වන මට්ටමෙහි ගෞරව උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

(ඇ) යම් තැනැත්තකුගේ පර්යේෂණ නිපුණතා සම්බන්ධයෙන් වන සුවිශේෂී කුසලතා මත, වසරක අවම කාලසීමාවකින් පසු ආචාර්ය උපාධි මට්ටම දක්වා උසස් කළ හැකි, දර්ශනපති උපාධියක් ශ්‍රී ලංකා ඉන්සිටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ දී හැදෑරීම සඳහා ලබාගත් වලංගු ලියාපදිංචියක් සමඟ ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ SLQF 6 වන මට්ටමෙහි ගෞරව උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම ; හෝ

(ඉ) යම් පුද්ගලයකුගේ පර්යේෂණ නිපුණතා සම්බන්ධයෙන් වන සුවිශේෂී කුසලතා මත, වසරක අවම කාලසීමාවකින් පසු ආචාර්ය උපාධි මට්ටම දක්වා උසස් කළ හැකි, දර්ශනපති උපාධියක් ශ්‍රී ලංකා ඉන්සිටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ දී හැදෑරීම සඳහා ලබාගත් වලංගු ලියාපදිංචියක් සමඟ, SLQF 6 වන මට්ටමට සමාන වන ආකාරයේ අධ්‍යයන සම්භාර 30 ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පවත්වනු ලබන සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම සහ GPA අගය 0-4 ක පරිමාණයකින් අවම වශයෙන් 3 අගයක් සමඟ ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයක දී හෝ උසස් අධ්‍යාපන ආයතනයක දී අදාළ විෂයය ක්ෂේත්‍රයක් යටතේ SLQF 5 වන මට්ටමෙහි උපාධියක් සම්පූර්ණ කර තිබීම.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| නැනෝ විද්‍යාව හා නැනෝ තාක්ෂණය පිළිබඳ දර්ශනවේදී | පීඑච්ඩී. (නැනෝ විද්‍යාව හා නැනෝ තාක්ෂණය) |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

05 - 681

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.